# පුංචි කූඩ



W.G. විතුලි ජේනුකි දිනුල්යා

# පුංචි කුඩ

W.G. විතුලි ජෙනුකි දිනුල්යා

කතෘ

කතෘ ගේ  වෙනත් කෘති

ජපානයේ මගේ පෙර පාසල (2024)

මහ/මහමායා බාලිකා විද්‍යාලය

මහනුවර

2026/05/10

ISBN 978-624-211-081-3

# පිළිගැන්වීම

අම්මයි අප්පච්චියි වැඩට ගිහාම මාව ආදරෙන් බලා ගන්න අත්තම්මාටයි අත්තාටයි ආදරෙන්.

# පෙරවදන



දින දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදු කරන හේමමාලා උපහාර ගතකරණ ව්‍යාපෘතිය නම් කල හැකිය. දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් සමග එක්ව හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණත සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට කුසලතා යොමුකරන ලදී. එහි ප්‍රතිපලයක් ලෙස ලෙස ලියවී ඇති ළමා ග්‍රන්ථ තුල ජනතාවගේ පුජනිය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කල ශ්‍රී දළදා වහන්සේ වැඩම කර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අරමුනයි. මේ සදහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් මග පෙන් වූ ගුරු හවතුන් ඇතුළු සැමට ස්තුතිය පුදකරමු.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

# සුභාසිංශන පණිවුඩය

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථ කරන ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළිදැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාසිංශන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සලකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත්වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය හා බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරන ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි. මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළිදැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී. එස්. අභයකෝන්
ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත
සම්මානිත මහාචාර්ය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026.05.10


## සුභාසිංශන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුල දූ දරුවන් ග්‍රන්රථකරනයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහමාය බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල් වල සහභාගිත්වයෙන් මෙවර පරම පුජනිය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩම කල හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එලි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කල මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය ඇතුළු ආචාර්‍ය මණ්ඩලය , ශිෂ්‍ය දියණිවරුන් සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයන්තය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමගින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටි. එවන් පසුබිමක සුසමහිත වූ සමබර පෞරුෂයක් සදහා නිර්මාණ හැකියාව, විචාරශීලි චින්තනය ඇතුලු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්තකරන වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිදු සරණින් හේමමාලා උපහාර ග්‍රන්තකරන ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවි මම ප්‍රර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල ,
දියවඩන නිළමේ ,
ශ්‍රී දළදා මාලිගාව.
2026.05.10

ඊයේ ඇදහැලුණු මහා වැස්සෙන් පස්සේ අද ලස්සනට ඉර පායලා. අම්මයි, අප්පච්චියි එක්ක මම අද උදේම වත්තට ගියේ, වත්තට එන කුරුල්ලෝ බලන්න.



කිචි බිචි හඬවල් ගොඩක් ඇසුන නිසා ඒ කවුද

කියලා අඳුරගන්න තමා අපි ආවේ.

ඒත් ඔන්න බිම බලනකොට තමයි අපි දැක්කේ

කොල රොඩු අතර තිබුණ පුංචි පුංචි කුඩ ගොඩක්.



හරිම ලස්සනයි. මම අප්පච්චිගෙන් ඇහුවා මේ මොනවද කියලා?

ඔයාලා දන්නවද ඒ මොනවද කියලා?

ඒවා හරියටම කූඹි පැංචංගේ, ගොලුබෙල්ලන්ගේ, කුරුමිනියන්ගේ කුඩ ද කියලත් මට හිතුනා.

අප්පච්චී, ඇත්තටම මේ මොනවද? මටත් එකක් ඕනි. එකක් කඩා ගන්නද?



“හෝ හෝ... කඩන්න එපා දෝනි. ඕවට කියන්නේ හතු කියලා. එහෙම නැත්තං බිම්මල් කියලත් කියනවා”. සමහර ඒවා විසයි.

බිම් මල්? ඒත් අප්පච්චී මේකට මලක් කිව්වට කෝ ගහක් නෑනේ.

එයාල වැස්ස නැති කාලෙට පොළොව යටට වෙලා ඉන්න දිලීර කියලා ඇසට නොපෙනෙන කුඩා ජීවීන් කොටසක්.

දිරපු කොල රොඩු වලින් පෝෂක අරගෙන පස ඇතුලේ මකුළු දැලක් වගේ හැදෙනවා. ඊට පස්සේ වහින කාලෙට  පොළොවෙන් උඩට මතු වෙනවා.

ඔය කුඩේ වගේ පොළොවෙන් උඩට මතුවෙලා තියෙන කොටසේ තියෙනවලු පුංචි පුංචි බීජ. හරියට ගස්වල මල් හැදිලා ගෙඩි එනවා වගේ.

මේ දිලීරත් පොළොව ඇතුලේ ඉඳලා උඩට එන්නේ බීජ හදලා එයාගෙ පරම්පරාව පවත්වාගන්නලු.



මම හොඳට බැලුවා ගෙඩි තියෙනවද කියලා. කෝ නැනේ. ඔන්න එතකොට අප්පච්චි හිනා වෙවී කියනවා "ඒ බීජ ගස් වල හැදෙන ගෙඩි තරම් නන්

ලොකු නෑ. අපේ ඇහැට පේන්නෙ නැති තරම් ගොඩාක් පුංචි යි. ඒවට කියන්නේ බීජානු කියලා.”

“හුළඟ මෙම බීජාණු ඈතට අරගෙන යනවා.

ඊට පස්සේ පොළවේ එහෙම නැත්තං දිරපු ගහක එහෙමත් නැත්තං කොළ රොඩු උඩ මෙම බීජාණු වැටෙනවා.

ගස්වල බීජ වලට වගේම පැළවෙන්නෙ ඕන කරන වතුර, උණුසුම ලැබුනහම බිම්මල් බීජාණුත් ආපහු පැලවෙන්න පටන් ගන්නවා. ඉතින්, ඔන්න ඔහොම තමයි බිම් මලක් හැදෙන්නේ” අප්පච්චි කියල දුන්නා.

එතකොට අප්පච්චි අපි කඩෙන් ගන්න හතු අම්මා උයල දෙනවනේ. ඒවා විස නැද්ද? මම අප්පච්චිගෙන් ඇහුවා.

"නෑ දෝනි. හැම හතු වර්ගයක්ම විස නෑ. සමහර ඒවා විසයි. සමහර ඒවා කෑමට ගන්නවා. සමහර හතු වර් ග බෙහෙත් නිෂ්පාදනය සඳහා ත් යොදා ගන්නවා". අප්පච්චි විස්තර කළා.

තව ටිකක් අපි ඇවිදගෙන යනකොට අප්පච්චි පෙන්නුවා ගස් වල හැදෙන, පොළොවේ හැදෙන, කොළ රොඩු උඩ හැදෙන හතු වර් ග ගොඩක්.

ඒවත් හරියටම අපි වගේ තමයි. එක එක හැඩයට එක එක පාටට හැදෙනවා.

බලන්න ඔයාලත් මේවා දැකල තියෙනවද කියලා.
















# පසුවදන



අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත් කතුවරුන් දැයට දායාද කළ මෙහෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වැඩසටහනක් බව අධ්‍යාපඥයන්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් වචනා කරන්නට යොමු කරවීම ව්‍යාපෘති ගමන් මගේ හැරවුම් ලක්ෂයකි. තාක්ෂණික පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වා දෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආශ්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකි නිසාය. තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩාවී ඇති පොතපතින් දරුවන් දුරස් සේම වළක්වා ගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් හේමමාලා උපහාර ග්‍රන්ථකරන ව්‍යාපෘතිය දියත් වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවාදනය යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසය යුග මෙහෙවරක් ඉටු කළ හේමමාලා කුමරියට උපහාර දැක්වීමද මෙහි මූලික අරමුණයි. මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුබවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සහසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද දියවඩන නිලමේතුමන් ඇතුළු සිය දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සත්කාරය වෙනුවෙන් ස්තුතිවන්ත වෙමු .

සෙනෙවිරත්න මහ ලේකම්, නිර්මාතෘ